# ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය

**ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින රෝහල් හා ආයතනවල ආයතන ප්‍රධානීන් පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම**

ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයුර්වේද රෝහල් හා ආයතනවල ආයතන ප්‍රධානී තනතුර සඳහා සුදුසුකම් ලත් ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | අවශ්‍ය සුදුසුකම් | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | වෛද්‍ය අධිකාරි | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I , II ශ්‍රේණියේ නිලධාරියකු වීම | 01 |
| 02 | කාර්යභාර වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I , II ශ්‍රේණියේ නිලධාරියකු වීම | 02 |
| 03 | ප්‍රධාන වෛද්‍ය නිලධාරි | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I , II ශ්‍රේණියේ නිලධාරියකු වීම | 01 |
| 04 | දිස්ත්‍රික් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය සම්බන්ධීකරණ නිලධාරි | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I , II ශ්‍රේණියේ නිලධාරියකු වීම | 02 |
| සටහන:- අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට තනතුරට බඳවා ගැනීමට අදාල සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කරන සියලුම සහතික වල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය. | | | |

02. **බඳවා ගැනීමේ ක්‍රමය**

- මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් ඉහත පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.
- I ශ්‍රේණියේ නිලධාරීන් නොමැති විට II ශ්‍රේණියේ නිලධාරීන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පූර්ණ කාලීනව වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.
- ක්ෂේත්‍රයට අදාල පශ්චාත් උපාධියක් හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා තිබීම, සේවා කාලය, විෂයානුබද්ධ දැනුම, පරිපාලනමය හැකියාව හා අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලැබේ. අනුමත නිර්නායක යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

03. අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර ගත් ජීව දත්ත තොරතුරු ඇතුළත් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානී හා අමාත්‍යාංශ ලේකම් මඟින්, අයදුම්කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බවට නිර්දේශය ද සමඟ 2023.09.06 වන දින හෝ එදිනට පෙර, "ඌව පළාත් ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, ඌව පළාත් සභාව, බදුල්ල" යන ලිපිනය වෙත ඉදිරිපත් කළ යුතු ය.

04. තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේනම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

05. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම හෝ නොකිරීම හෝ මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු ය. මේ පිළිබඳව විස්තර කාර්යාල වේලාව තුළ දුරකථන අංක 055-2229426 ඇමතීමෙන් ලබා ගත හැකි බව වැඩිදුරටත් සඳහන් කරමි.

(ඩබ්.එම්.ආර්.රංජිත්)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

අත්සන් කළේ:- දමයන්ති පරණගම
ඌව පළාතේ ප්‍රධාන ලේකම්

දිනය :- 2023.08.18